





ආචාර්ය
සේන නානායක්කාර


# ජාතික නිදහස, නිදහස් චින්තනය හා කුමරතුඟු මුනිදස් දැක්ම

ජාතියෙකැ ඖදාර්යය ඇති වනුයේ ඒ ජාතියේ මිනිසුන් නිදහස් වූ පමණට යැ. මිනිසකුගේ අදහස් යම් පමණකට නිදහස් ද උහුගේ නිදහස් බව ද එයින් මැ මනිනු ලැබේ. මෙසේ හෙයින් නිදහස් අදහසෙකැ අගය මෙතෙකැයි නො කියැ හැකි යැ.

කිමෙක් ද අදහසෙක ඇති නිදහස නම්? තමන්ගේ අදහස, ස්වසාමයික ග්‍රන්ථයෙකැ මතයට හෝ, ස්වකීය ගුරුන්ගේ අදහසට හෝ, ස්වකීය පරපුරෙහි කල්පනාවට හෝ යටත් නො කොටැ අභීත වැ ආලෝකයට පෑම ය. එහෙත් සතතයෙන් මැ මෙනෙහි කළ යුතු කාරණයක් ඇත්තේ යැ. එනම් කවර අදහසක් වුව ද සත්‍යයට යටත් නො වේ නම්, එයින් අවැඩක් මුත් වැඩක් නො සැලසෙන්නේ යැ. විමර්ශනයට හරනා ලද රාජද්වාර ඇති මෙබඳු ආලෝකවත් කාලයෙකැ නන් දෙසින් නිදහස් අදහස් ප්‍රකාශ වනු දැක්ම අපගේ බලවත් සොම්නසට හේතුවෙකි. ජාතික පෝෂණයට මෙයට වඩා අවශ්‍ය වූ, මෙයට වඩා උසස් වූ අන් එක ද කාරණයක් නැති හෙයිනි. එහෙත් සත්‍යයට පාද ප්‍රහාරය දී, දමිත ශමිත ගුණයන් කෙරෙන් ඈත් වැ, ප්‍රඥානුගත වූ විමර්ශන ලක්ෂණයන්ගෙන් දුරුකොටැ කෙරෙන මත ප්‍රකාශය සැබැවින් මැ අනර්ථකර යැ."[1]

විසිවන සියවසේ ලක්දිව පහළ වූ ශ්‍රේෂ්ඨතම පඬිවරයාණන් ලෙස ගැනෙන කුමරතුඟු මුනිදසුන් ලියා පළ කළ අදහසකි ඒ. ජාතියක, දේශයක හෝ යම්කිසි නිශ්චිත ජන කොට්ඨාසයක උදාරත්වය හා බැඳුණු අදීන පෞරුෂ ත්වය කෙරෙහි නිදහස් චින්තනය බැඳී පවත්නා අයුරු ඉන් කියැවෙයි. මේ කෙටි නිබන්ධයෙන් අපේක්ෂා කෙරෙනුයේ කුමාරතුංග චින්තනය, ජාතික නිදහස සොයා ගිය අයුරු සරලව විමසා බැලීම යි.

මානවයා හුදෙක් සමාජ සත්වයෙකු වශයෙන් බිහි වූ දා පටන් අවිඥානික ව හෝ ඔවුන්ගේ සිත් තුළ "නිදහස" මුල්බැසගෙන තිබෙන්නට ඇත. දෑත නිදහස් කොට දෙපයින් නැගී සිටින්නට සමත් වූ මේ සජීවී සත්වයා පසුකාලීන සමාජ විකාශනයෙහි පෙරගමන්කරුවා විය.[2] ඒ, ඔහු සතුව පැවැති සිතීමේ, විමසීමේ හා යම් යම් කාර්යයන් හි නියැලීමේ ජීවවිද්‍යාත්මක ශක්‍යතාව පදනම් කොටගෙන යි.

ගල් යුගයේ දී හෙවත් දඩයම් යුගයේ දී සතුන් මරාගෙන ජීවිතය ගෙවා දමන්නට ත්, එඬේර යුගයේ දි සිය ජීවිත පවත්වාගෙන යාම උදෙසා කෘෂි හා සත්ත්ව බෝග නිෂ්පාදනය කරන්නට ත්, කාර්මික යුගයෙන් අනතුරු ව විධිමත් මානුෂිකත්වයක් ප්‍රකට කරන්නට ත් ඔහුට හැකි වූයේ එබැවිනි.

මේ සකලවිධ ක්‍රම විකාශනයන්ගේ ත්, සමාජ ප්‍රවර්ධනයන්ගේ ත් කේන්ද්‍රීය අඩිතාලම නිදහස් චින්තනය යි. මිනිසාට කන්නට, බොන්නට, අඳින්නට මෙන් ම ලියන්නට, කියවන්නට, විනෝද වන්නට මෙන්ම සාකච්ඡා හා සම්මන්ත්‍රණ පවත්වන්නට ද නිදහස අවශ්‍ය වන්නේ ඒ බැවිනි. එසේ නො වී නිදහස් චින්තනයක් බිහිකිරීම උකහට ය. සමාජයේ ගතානුගතික වූ ත්, නිෂ්ඵල වූ ත් සම්මතයට ප්‍රබල බුද්ධිමය අභියෝග එල්ල කළ හැක්කේ නිදහස් චින්තනය ක්‍රියාත්මක වූවොත් පමණි. එකී මත ගැටුම් මිනිස් සමාජය දිනෙන් දින අලුත් කරවයි. ශිෂ්ටාචාර ගොඩනැගී ඇත්තේ ද එපරිද්දෙන් බව අපේ ඓතිහාසිකත්වය ප්‍රත්‍යවේක්ෂණය කිරීමේ දී පැහැදිලි වෙන සත්‍යය කි. එහි දී විද්‍යා, කලා, ආගමික හා දේශපාලනික ක්ෂේත්‍රයන් හි මත ගැටුම් මිනිස් ඉතිහාසයේ සුවිශේෂ සන්ධිස්ථාන සනිටුහන් කරන බව කීම අතිශයෝක්තියක් නො වේ.

නිදර්ශනයක් ලෙස පෘථිවිය විශ්වයේ කේන්ද්‍රය ලෙස විශ්වාස කළ යුගයක් විය. මෙකී කේන්ද්‍රස්ථානය පාලනය කරනු ලබන මහේශාක්‍ය වූ දෙවියන්වහන්සේ උරණ කොට නො ගෙන එය අදහන ලෙස එවක

මූලධර්මවාදී ආගම් නායකයෝ මිනිසාට දේශනා කළ හ. එහෙත්, ප්‍රබල වූ මිනිස් චින්තනයට වැටකඩොලු බැඳිය නොහැකි බව හෙළිකරමින් සූර්ය කේන්ද්‍රවාදය පිළිබඳ අදහස කොපර්නිකස් විසින් හෙළි කරන ලදී. විශ්වයේ පැවැත්ම තහවුරු කෙරෙන ජීව, රසායන හා භෞතික විද්‍යාත්මක ක්‍රියාකාරිත්වය තේරුම් ගන්නට උත්සාහ කරමින් සිටි බුද්ධිමත් හු පවා එම ආකල්පය පිළිබඳ සැක පහළ කළ හ. විශ්වයේ මැවුම්කරුවාණන් කොපාවිෂ්ට වේ යැයි පූජකයෝ කී හ. හිරු, සඳු, තරු හා පෘථිවිය ඈ නන්විධ ද්‍රව්‍යාත්මකයන් කෙරෙහි ලා හුදු දේවත්වය ම ආරෝපණය කොට සිටි ඔවුහු ඊට විරුද්ධ වන්නන්ට මරණ දඬුවම පවා නීතිගත කරනු ලැබූ හ. ඒ අනුව කොපර්නිකස් මතය ජනතාව අතර ප්‍රචලිත කළ වරදට බෲනෝ පුළුස්සා මරා දමනු ලැබී ය. එහෙත්, අද අපි කොපර්නිකස් අදහමු. සත්‍යය එය බැවිනි.

නිදහස් චින්තනය සම්බන්ධයෙන් ගත් කල මෙය මුළුමහත් මානව ඉතිහාසය ම කැටි කොට ගත් අංශුමාත්‍රික සරල නිදර්ශනය කි. මීට ම සමාන්තර සමාජ සංසිද්ධීන් අපමණ ය.

ඇරිස්ටෝටල්, ප්ලේටෝ, සොක්‍රටීස්, ගැලීලියෝ, ආකිමිඩීස් හා කොපර්නිකස් ආදී නිදහස් චින්තකයින් හෙළි කළ මග ඔස්සේ නිදහස් චින්තනය කෙරෙහි ලා දිවි කැප කළ මහා පුරුෂයෝ කිහිපදෙනෙක් වෙති. 17 වන සියවසේ ජීවත් වූ ජෝන් මිල්ටන් (1608 - 1674) දහ අටවන සියවසේ ජීවත් වූ ජෝන් අර්ස්කින්, තෝමස් ජෙෆර්සන් හා දහ නව වන සියවසේ ජීවත්වූ ජෝන් ස්ටුවර්ට් මිල් (1806 - 1873) ඒ අතර වෙති. ගුරුත්වාකර්ෂණය පිළිබඳ තතු හෙළි කළ අයිසෙක් නිව්ටන්, මානවයාගේ පරිණාමය හඳුන්වා දුන් චාල්ස් ඩාර්වින් වැන්නවුන්ගේ නව සොයාගැනීම් මෙන් ම, ඇඩම් ස්මිත් ගේ නව ආර්ථික සංකල්ප, ජෝන් ලොක් හා රූසෝ වැන්නවුන්ගේ සමාජ හිතවාදී නව අධ්‍යාපනික උපදේශනයන් ද මෙකී නිදහස් චින්තනය ප්‍රචලිත කරවන්නට හේතුකාරක විය. නවලෝක දේශපාලන ආර්ථිකය, භෞතිකවාදී දර්ශනය හා විද්‍යාත්මක කොමියුනිස්ට්වාදය පිළිබඳ අදහස ප්‍රචලිත කළ කාල් මාක්ස් (1818-1883), ෆ්‍රෙඩ්රිච් එංගල්ස් (1820-1895) හා ව්ලැඩිමීර් ඉල්ව්ච් ලෙනින් ද (1870-1924) එකී ක්‍රියාවලියෙහි ප්‍රමුඛ පුරෝගාමී හු වෙති.[3] පොදු මානව ශිෂ්ටාචාරය ගොඩනැගී ඇත්තේ එබඳු නිදහස් චින්තන සමුදායක විපුල ඵල ලෙසිනි. නිදහස් චින්තනය එතරම් ම ප්‍රබල ය.

සමාජ, ආර්ථික, සංස්කෘතික හෝ දේශපාලනික මතයක් ජන විඥ්ඥාණගත පදනමක් ලෙස ශක්තිමත් වූ කල මානව පරම්පරාවේ

පැවැත්ම ඒ මත රඳා පවතිනු ඇත. එය සමාජයේ ප්‍රගමනයට පිටුවහලක් විය හැකි ය. නො එසේ නම් පරිහානිය කෙරෙහි ලා වන බලපෑම් සාධකයක් ද විය හැකි ය. කෙසේ වුව ද, නව නිදහස් චින්තනය විසින් සමස්ත මනුෂ්‍ය වර්ගයා වෙත ආලෝකය සපයනු ලබන බව නම් ඉතිහාසය ඉතා පැහැදිලි ව ප්‍රත්‍යක්ෂ කොට ඇති සත්‍යයකි. මන්දයත්, එමගින් බුද්ධිමය තර්ක හා සංවාද අන්තරයෙන් බිහිවන්නා වූ නව ලෝක දෘෂ්ටියක් පතළ කරන්නා වූ බැවිනි.

ඒ අනුව සලකා බලන කල කුමරතුඟු මුනිදසුන් ප්‍රකට කළ සමාජ දර්ශනය, ජාතික නිදහස උදෙසා වූ ප්‍රතිබල සම්පන්න කාර්යභාරයක් ලෙස හඳුන්වා දිය හැකි ය. පරදේශක්කාරයන් විසින් පාලනය කරන ලද යටත් විජිතයක් ලෙස පැවැති රටක, පොදු මහජනයා අතර පවත්නා පරාදීන චින්තනය මුළුමනින් ම රජකළ යුගයක, එ රටේ ජාතික නිදහස උදෙසා යම්කිසි සමාජ කාර්යභාරයක් ඉටුකිරීම අතිශය දුෂ්කර ය. අතිශය උත්තරීතර උගත්කම් ප්‍රකට කළ, දැනුම, අවබෝධය හා නිර්ව්‍යාජ විචාරශීලීත්වය පෙන්වූ එතුමෝ සැබෑ ප්‍රාඥයෙක් වූ හ. ස්වකීය භාෂාව හා සාහිත්‍යය කෙරෙන් ජාතික නිදහස අර්ථවත් වන අයුරු එතුමෝ පසක් කළ හ. හෙළ තෙරුවන ලෙස ගැනුණු දෙස බස රැස නංවාලීමට එමගින් ඉටුකෙරුණු මෙහෙවර අනුපමේය වෙයි; සදානුස්මරණීය වෙයි. පුද්ගල චරිතයක දුලබ ව දක්නට ලැබෙන නෛසර්ගික කුසලතා සමුදායකින් යුක්ත වූ ත්, අභිමානවත් නිදහස් චින්තකයකු වූ ත් කුමාරතුංගයෝ, හෙළ භාෂා සාහිත්‍යය තුළ අග්‍රේශර වෙති. ඔහු සතු ව පැවැති ප්‍රශස්ත පාණ්ඩිත්‍යය ද, විස්මජනක භාෂා ඥාණය ද, අපූර්වතම නිර්මාණ කෞශල්‍ය ය ද, දෘඪතර දේශවාත්සල්‍යය ද, ඒ සියල්ල කැටිකොට ගත් අදීන විචාර බුද්ධිය ද සුවිශේෂ ය.

"තා කුමක් කීවත්
සිය බස කෙලෙසා අපට
නිදහසෙක් නොම ලැබේ
පටන්ගන්නැ සිය බසින්.........."

හිරු නොබසින අධිරාජ්‍යයේ නායකකාරකාදීන් වෙත වැඳ නමස්කාර කරමින්, උනට වහල්කම් කරමින් සිය ජනයා පාලනය කරන කළු සුද්දන් හමුවේ මෙබඳු ප්‍රකාශ කිරීම වීරත්වය කි. සිංහලය පාගා දමා අන්ධ භක්තියෙන් ඉංග්‍රීසිය වැළඳ ගන්නා ප්‍රවණතාවක් තුළ, 'බසමය රැස දෙස', යන සුභාෂිතය පතළ කළ එතුමෝ වඩාත් නිර්භීත අදීනයෙක් වූ අයුරු විස්මජනක ය.

"මා දෙස හෙළ දෙස වෙන කිසි දෙසකට
මා රැස හෙළ රැස වෙන කිසි රැසකට
මා බස හෙළ බස වෙන කිසි බසකට
මේ හිස නොනමමි මා නම් කිසිවිට"

හෙළ සමාජ සංස්කෘතික ජීවන ක්‍රමය දෙදරා යාම ත්, සියල්ල යටත්විජිත පාලනය හා බැඳුණු පරාදීන සම්ප්‍රදායයක් තුළ පීඩාකාරී ලෙස සිරගත ව පැවැතීම ත් එවක සුවිශේෂ සමාජ විචල්‍යතා ලෙස කැපී පෙනිණි. අන්ධානුකරණය හා භාෂා සාහිත්‍යය පිටුදැකීම වැනි සමාජ දුර්ලක්‍ෂණයන් පරිහානියේ අන්තය කරා ඔඩුදුවද්දි එතුමෝ තව තවත් සක්‍රිය වූ හ. අධිරාජ්‍යවාදීන් පිටුදැකීම ත්, දේශාභිමානය ව්‍යාප්ත කිරීම ත්, භාෂා සාහිත්‍ය දැනුම වගා කිරීම මෙන් ම අදීන චින්තනයක් සහිත සමාජයක් ගොඩ නැගීමත් කුමරතුගුන්ගේ අපේක්‍ෂාව විය.

සිය බස පිළිබඳ උනන්දුව, රසය සහ සැබෑ අවබෝධය වර්ධනය කිරීම ඔහු එහි ලා භාවිත උපක්‍රමය විය. "වස දොස මැඬි - බස රස වැඩි" යන්න ආප්තෝපදේශයක් ලෙස ගිනිය හැක්කේ ද එබැවිනි. ජාතියක අව්‍යාජ නිදහස හා එකී ජාතියේ භාෂාව අතර පවත්නා සබඳතාව වූ කලී හුදු ප්‍රලාපයක් යැ යි සිතන පුස්සන් අද ද අප අතර සිටිය හැකි ය. එය එසේ තිබිය දී උක්ත සංකල්පය පිළිබඳ ප්‍රාමාණික දැනුම් සහිත භාෂා විශාරදවරයකු දැක්වූ මේ අදහස විමසා බලමු.

"බස නැංවීමෙන් දෙස නිදහස කරා නැංවිය හැකි ය යන්න එංගලන්තයේ 19 වන සියවසේ විසූ ජෝන් මිල්ටන් කිවියා ද පළකොට තිබූ අදහසකි. ඔහුගේ මතය වූයේ වදන් මිල බාලකොට ලාබකොට වදන් හඳුනාගැනීමට බැරි තතුවට පත්කළ බසක් කතා කරන ජනයා පාලනය කිරීමට නොව, පාලනය වීමට ම සුදුසු ගැත්තන් පිරිසක් වන බව යි. මෙය ලොවේ දියුණු යැයි පිළිගත් සෙසු ජාතීන් ද පිළිගත් මතයෙකි. එහෙත්, මෙ මතය මුලින් ම සිංහල භාෂාවෙහි ලා මතුකොට බස නිරවුල් පණවත් ඔදවත් තතුවකට නංවා එමගින් ජාතිය අභිමානයෙන් යුතුව නැංවීමට කුමාරතුගුවෝ කැප වී කටයුතු කළ හ. ඒ සඳහා ඔවුන් ගත් මග බස මුළුමනින් ම නිරවුල් කිරීම, පැරණි හෙළ පොත පත හෙළි කිරීම, හෙළ කවි මග පෑදීම, නව පතපොත සැපයීම, හෙළ යටගියාව සැබැඳියාව ඈ මතුකිරීම, හෙළ නළුව සගයුව ඈ කලා පණගැන්වීම, හෙළයන් තුළෑ දෑ ඇලුම පිබිදවීම ආදී වශයෙන් ඔවුන් ගත් මග නන් වැදෑරුම් ය."[4]

විචාරය, විමර්ශනය, විරෝධය, අදීනත්වය, අසම්මතය, අයුක්තිය නොඉවසීම, සත්‍යය ස්ථාපනය, ව්‍යාජය පිටුදැකීම හා සාම්ප්‍රදායිකත්වය අරුත්බරව වෙනස් කිරීම ආදී ප්‍රගතිශීලී සංලක්ෂණ ඔහුගේ කාර්යභාරයන් තුළ කුළුගැන්විණි. වියරණය, විවරණය, පද්‍යකරණය, ග්‍රන්ථකරණය, ප්‍රවෘත්ති පත්‍රකරණය ඈ සද්කාර්යයන් කෙරෙහි එකී සංලක්ෂණ මැනැවින් ප්‍රකට කෙරිණි. මේ අභීත ප්‍රකාශය ඊට සංනිදර්ශන ය.

> "පාඨශාලා අතින් පෙනීයනුයේ ජාතිය වැනසෙන ලකුණු යැ. මීට වගකිව යුත්තෝ ශික්ෂකයෝ නො වෙති. පරීක්ෂකයෝ නො වෙති. අධ්‍යාපනාධ්‍යක්ෂයෝ නො වෙති. එසේනම් කවරහු ද? අපේ දරුවනට සුදුසු දැ අපි නොදනිමු නම්, නුසුදුසු දැ කරන කල්හි වළකන්නට අපි ඉදිරියට නො යමු නම්, අප විසින් මැ රජමැති මඩුල්ලට යවනු ලබන්නවුන් කරන කියන දැ අපි නො විමසමු නම්, කවුරුන් කුමක් කෙසේ කීවත් කළත්, අත් පොළසන් දෙන්නට ත්, පෙරහර කරන්නට ත්, මල් මාලා පළඳවන්නට ත් සැරසෙමු නම්, අවුරුදු පහක් මුළුල්ලේ මැ අවැඩක් මුත් වැඩක් නම් නොකොටැ, යළිත් රජමැති මඩුල්ලට වැදගන්නට සැරැසී ඉදිරියට අවුත්, නැති හිතවත් කම් පෙන්වා, බොරු කයිවාරු කළ කල්හි යළිත් අපේ සැඳ (ඡන්දය) දෙන්නට විළි නැතුව ම යෙමු නම් අපට හෙණ පහර විනා අන් කිමෙක් නම් සුදුසු ද?" 5

සාම්ප්‍රදායික දීන බව පිටුදැකීමේ යථාර්ථවාදී ප්‍රවණතාව කැපීපෙනෙන මෙබඳු ප්‍රකාශයක් නිදහස සොයා යන ජාතියකට කෙතරම් ඵලදායක ද? සුද්දන් මෙන්ම කළු සුද්දන් ද අන්ධානුකරණයෙන් පිදුම් ලබන මොහොතක මෙබඳු චින්තනයක අරමුණු කෙතරම් ප්‍රායෝගික ද? මේවා ඇත්ත යුත්ත ප්‍රතිසන්ධි ගලපා විසඳාලිය යුතු ගැටලු වෙයි. සැබැවින් ම, කුමාරතුංග චින්තනය විසින් ප්‍රකට කරනු ලැබූ සාම්ප්‍රදාය විරෝධී විප්ලවීය ඕජෝ ගුණය ප්‍රශස්ත ය.

> "ඒ ඒ තැනට සුදුස්සෙක් පැමිණැවීමේ උතුම් සිරිත මේ රටෙහි නැත. එහෙයින් රට හදන්නට ඉදිරියට එන්නේ බෙහෙවින් නුසුදුස්සෝ යැ. රජයේ අන්තිම ප්‍රමාණයේ තනතුරකට පත්වුයේ ද, රටුන් පෙළන්නට, ඔවුන්ගෙන් පුද ගන්නට, නොනිසි ගරු බුහුමන් ලැබගන්නට සැරැසෙයි. ශතවර්ෂ කිහිපයක් මැ ඇතුළතැ පිටතැ මිතුරු සතුරු උපද්‍රවයන්ගෙන් පෙළී, ගැලැවෙන වෙන අතක් නැති වැ කවර නීචයකු ඉදිරියෙහි

වුවද වැඳ වැටෙන්නට ද යැදැ පෙරළෙන්නට ද පුරුදු වැ දීන වැ ඉන්න රටවැසියෝ ද , පැමිණි කාරිය කවර නීච පැවැත්මෙකින් වුව ද ඉටුකැරැ ගතහොත් ඇත. දැරුවනට කුමක් වුව ද කම්නැතැ' යි සිතන්නට සැරැසී සිටිති. රට වැසියන්ගේ මේ උදාසීන දීනතාව දුරු නොවන තෙක් දියුණුව නම් අඟලකුදු ළං නො වේ."[6]

සමකාලීන සමාජය තුළ ඉස්මතු ව පැවති දීන බව මුලිනුදුරා දැමිය හැක්කේ දරු පරම්පරාව නිදහස් චින්තනයෙන් සන්නද්ධ කරවීමෙන් බව කුමාරතුංගයෝ විශ්වාස කළ හ. දරුවා නිවැරදි දේ උගෙනීම ජාතිය යහමග යැවීමක් ලෙස ත්, දීන වැඩිහිටියන් දරුවන් මෙහෙයැවීම ජාතිය නොමග යැවීමක් ලෙස ත් එතුමෝ දැඩි ලෙස අවධාරණය කළ හ. මේ ඒ සඳහා නිදසුන් දෙක කි.

"දීන භාවයේ සිටින්නවුන් නො කළ යුතු ම කාරිය නම් දරුවන් හික්මවීම යි. දරුවන් දීනයන් වූ කලැ ඔවුන් නිසා උපදනා දරුවෝ පරම දීනයෝ වෙති. අන්තිමයේ මුළු ජාතිය මිනිස් නමින් පෙනී සිටින්නට කැමැති කැනහිලුන්ගෙන් යුක්ත වෙයි........"[7]

"අපගේ අනාගතය ගැන අප දක්වන සැලකිල්ල ඉතා මඳ යැ. අනාගතය අතින් මුලටම නැගී පෙනෙනුයේ දරුවන් හික්මැවීම යි. දැන් අපේ දරුවනට ලැබෙන හික්මැවීම අධ්‍යාපනය කිසිසේ ත් තරම් නොවේ. මේ හික්මැවීමේ දෝෂයෙන් දිනෙන් දින නිකම්මු බෝ වෙති. ස්වභාෂාව කිළිටි වෙයි. ස්වදේශ ඉතිහාසය පස්සට යයි.,[8]

සාම්ප්‍රදායික සංකල්පයෙහි එල්බගත් ගතානුගතික උගතුන්ට ඔහුගේ ලියැවිලි අකුල් පහර සේ පෙනිණ. මඟ යා හැකිව තිබිය දී නොමග යමන් සිටින ජාතියක පරිහානිය වැලකීමෙහි ලා සමාජ ශෝධනය අපේක්ෂා කොටගත් එතුමෝ සකලවිධ සමාජ පාර්ශවයන් සිය දොෂ දර්ශනයට හසුකර ගන්නට ප්‍රෝත්සාහි වූ හ. හාස්‍යය, උපහාසය හා අපහාසය ද ඒ අතර කැපී පෙනිණි. අසත්‍යය සත්‍ය සේ පෙන්වාදෙන පඬිවරුන්, වියතුන් සේ පෙනී සිටින අවියත් මහාචාර්යවරුන්, ශීලවන්ත ඥානවන්තයන් සේ පෙනී සිටින අඥාන දුශ්ශීල භික්ෂූන්, අන්ධ විශ්වාස කර පින්නාගත් බෞද්ධයින්, නිලධාරීන්, මැති ඇමැත්තන් හා දේශපාලන නායකයින් ඇතුළු යුක්තියේ නාමයෙන් අයුක්තිය පතුරුවන රජයයන් ද එතුමන්ගේ කර්කශ ප්‍රහාරයට දැඩි ලෙස ගොදුරු විය.

සියලු සමාජ අක්‍රමිකතා කෙරෙහි පදනම් වන මූල කේන්ද්‍රය වන්නේ අයහපත් දේශපාලන යාන්ත්‍රණය බව එතුමෝ විශ්වාස කළ හ. රට ත්, ජනතාව ත්, රටේ යහපත් අනාගතය ත් ගැන දැක්මක් ඇති ජනතා නියෝජිතයින් රටක දියුණුවෙහි ලා ගාමක බලවේගය බව එහිදී අවධාරණය කෙරිණි. එබඳු ජන නායකයින් තෝරා පත්කර ගැනීම පිළිබඳ එතුමන් විසින් පළ කරන ලද අදහස් සමුදාය අතිශය සුවිශේෂ ය. නායකකාරකාදීන්ගෙන් අනිසි ලෙස පිදෙන දහසින් බැඳි පියලි අපේක්ෂා නොකළ කුමරතුඟුවන්, ඔවුන් නිර්දය ලෙස විචාරන්නට ත්, එබඳු සමාජ විරෝධීන් තෝරා පත් කරගන්නා ජනතාව දීනයින් ලෙස හංවඩු ගසන්නට ත් මැලි වූයේ නැත. මෙකී ප්‍රකාශය කියවා බලන්න.

> "දැන් ඉන්නා මැතියකු යළිදු මැති සබයට තෝරා ගන්නට පෙර, පහුගිය හවුරුදු කිහිපය තුළැදී එක් එක් මැතියා කළ කී දැ මැනැවින් ගණනට ගත යුතු වෙයි. අපේ සැඳින් මැති සබයට ගොස් අපේ ඒ සැඳට ම පයින් ගසා යම් යම් දේ කියැවිණි ද? යම් යම් දේ කැරිණි ද? අප විසින් ඒ සියල්ල ම පරීක්ෂා කළ යුතු වෙයි. අපට නෑ වූ බව, අපට මිතුරු වූ බව, අපේ ගමෙහි මැ හෝ නුවරෙහි ම හෝ ඉන්නා බව, අපට යම් යම් විටැ යම් යම් උදව් කළ බව මෙහිදී කිසිසේ ත් සැලැකිය යුතු නොවේ. රටට විය හැකි වැඩ අවැඩ දෙක පමණක් මැ අපගේ මනැස ඉදිරියේ පිහිටුවාගත යුතු යැ."[9]

ජනතා පරමාධිපත්‍ය පිළිබඳ හැඟීම සමාජගත කරවන්නට කුමරතුඟුවන් ගත් උත්සාහය අපරිමිත ය. සියල්ල සිදුවනුයේ දේශපාලන පසුබිමක් තුළ වන හෙයින්, එහි පූර්ණ බලතල හිමිකාරිත්වය ජනතාව සතුවිය යුතු බව ත් නිවැරදි තෝරාගැනීමකින් තොරව යහපත අපේක්ෂා කළ නොහැකි බවත් එතුමෝ අවධාරණය කළ හ. ඡන්දය නිසි ලෙස භාවිත නො කිරීමෙන් සිදුවන හානිය ජාතියේ පරිහානිය දක්වා ම ගමන් කරන බව මෙයින් පෙන්වා දෙයි.

> "අවංකයන්, අභීතයන්, වීරයන් රටෙහි ඇතිවන්නට නම් රට සුවපත් විය යුතු යැ. රට සුවපත් වන්නට නම් පොහොසත් බව ඇති විය යුතු යැ. පොහොසත් බව ඇතිවන්නට නම් රටෙහි නිදහස ඇති විය යුතු යැ. නිදහස ඇතිවන්නට නම් මහජනයාට වුව මනා පරිදි රජය කළ යුතු යැ. මහජනයාට වුව මනා පරිදි රජය කරන්නට නම් සුදුස්සන් ම මැති

සබයට තෝරා ගත යුතු යැ. සුදුස්සන් ම රජමැති සබයට තේරෙන්නට නම් අපේ සැඳ නිසි ලෙස යෙදිය යුතු යැ."[10]

ජාතිකාභිමානය, දේශවාත්සල්‍යය හා ජගත් සෞන්දර්ය පිළිබඳ හැඟීම ළමා මනස තුළ ඇතිකොට පෝෂණය කිරීමෙහි ලා ඔහු විසින් නිර්මිත ළමා සාහිත්‍යය අතිශය ප්‍රශංසා කටයුතු ය. හුදු උපදේශාත්මක සාහිත්‍යයකට වඩා සාංකල්පික වශයෙන් ළදරු මනස සංතෘප්ත කරවීමෙහි ලා එතුමන් ගත් වෙහෙස වෙසෙසින් කැපී පෙනේ. හීන් සැරය, හත්පණ, මගුල් කෑම, නිකම්කම හා බැගෑව ආදී කෘතීන් හි පවත්නා උසස් ජීවන අර්ථ සමුදාය විපුල ඵලදායක ය. මේ "මඟුල් කෑම" හි එන සංවාද ඛණ්ඩය කි.

"නුවණහාමි මඳක් ඉඟිමරා සරදම් සිනාවක් සී පිළිතුරු දුන්නේ යැ. මිනිසුන්ගේ සිරිත් දැන් නරින්ගේ සිරිත් පමණ හොඳ නැති බව තවම දන්නේ නැති ද? මිනිස්සු ඒ ඒ තැනට පහසු අන්දමට ඒ ඒ දේ වෙනස් කෙරෙති. ඔහු පෙර දවල් මගුල් නොගත් හ. අද ගනිති. පෙර පාවහන් ලා පුවරුවට නො නගිති. අද නගිති. පෙර පිළී සැබැවින් ම ඇන්දවූ හ. දැන් පිටින් කටු ගසා මහා බොරුවක් කෙරෙති. ඉතින් එබඳු නරන්නේ සිරිත් දැ අපට ගන්නට කියන්නේ?"

වසර පනස් හයක ජීවිත කාලයක් අතරතුර වසර විස්සක් බඳු කෙටි කාලයක දී එතුමන් විසින් නිම කරන ලද කෘතීන් සංඛ්‍යාව ශතකයකට අධික ය. විවරණ ග්‍රන්ථ 35 ක්, සංස්කරණ 26 ක් හා නව නිර්මාණ කෘතීන් 38 ක් ඒ අතර වෙයි. සියල්ල සම්‍යක්දෘෂ්ටිය ඇතිව විචාරිය යුතු බව ත්, විචාරයෙන් තොර ව කිසිවක් ඵලදායක නොවන බව ත් එතුමෝ අවධාරණය කළ හ. අවංක විචාරය තුළින් නව දෘෂ්ටීන් එළිදැක්වෙන බව ත්, එය සකලවිධ සමාජ පාර්ශවයන් කෙරෙහි සාධනීය ලෙස සැපයෙන පිටුබලයක් බව ත් එහිදී අවධාරණය කෙරේ. මුවදෙව්දා විවරණ ප්‍රස්ථාවනාවෙහි සඳහන් මේ ප්‍රකාශය කියවන්න.

"ගුරුන් වරදක් කී කලැ ද ඒ එසේමැයි නොවිමසා ගැන්මෙන් ලෝකාභිවෘද්ධියට බාධා පැමිණෙයි. මේ අපගේ ආචාර්ය පරම්පරායෙහි කී සැටි යැ. මේ අපගේ සීයන් කී සැටි යැ. මේ අපගේ නෑයන් කී සැටි යැ යි යම් යම් දේ නොවිමසා පිළිගැනීම මුග්ධ ක්‍රියාව කි."

කුමරතුඟුන් විසින් ගැඹුරු විමසුමට ලක් කරන ලද ශාස්ත්‍රීය කෘති සංඛ්‍යාව 35 කටත් අධික වූයේ එබැවින් ම විය හැකි ය. අප චිරන්තන සාහිත්‍ය කෘති කෙරෙන් නව දෘෂ්ටීන් පතළ කරන්නට ත්, එමගින් නූතන ගද්‍ය පද්‍ය සාහිත්‍යයෙහි ලා පනව ආලෝකය විහිදුවන්නට ත් එමගින් එතුමෝ සමත් වූ හ. නිදහස් චින්තනයෙහි ලා සමාජය පොළඹවන්නට මීට වඩා නිසි මඟ කවරක් ද?

> "කවර ශාස්ත්‍රයක් වුව ත් විමසිය යුතු යැ. විමසා දත් දෙය ප්‍රකාශ කළ යුතු යැ. ශාස්ත්‍රයාගේ නිර්මලත්වය මතුවනුයේ මෙහිදී යැ. විමසීම දැකැ වැනැසීම යි සිතා වැලැපීමෙන් නොවේ."[11]

ලක්මිණි පහන, සුබස, ස්වදේශ මිත්‍රයා, දිනමිණ, ස්වරාජ්‍ය, විද්‍යෝදය, විද්‍යාදර්ශය හා ශ්‍රී ධර්ම ශ්‍රී යන පුවත්පත් හා සඟරාදිය සඳහා කුමරතුඟුන් විසින් ලියන ලද නිර්මාණශීලී විචාරාත්මක ලිපිලේඛන දහස් ගණන කි. එවක නිදහස් චින්තකයෙකු සතු විචාරාත්මක අවබෝධය ස්වකීය ජාතිය කෙරෙහි පතළ කිරීමෙන්, සමස්ත ජාතියේ නිදහස ත්, අනාගත අදීන ගමන්මඟත් පිළිබඳ සංඥා එළිය දැල්විණි. එකී ආලෝකය එදාට වඩා අවැසි වන්නේ අදට යැයි මම හඟිමි.

මූලාශ්‍රය


1. කුමාරතුංග මුණිදාස, ලක්මිණි පහන (කතුවැකිය), 1935 ජූලි 02
2. එම්. ඉලින්, වයි. සෙගාල්, මිනිසා යෝධයෙකු වූයේ කෙසේ ද?, අනුවාදය නාරාවිල පැට්‍රික්, රාදුගා ප්‍රකාශකයෝ, මොස්කව්, 1990
3. වී. බුසුයෙව්, වී. ගොරොද්නොව්, මාක්ස් ලෙනින් වාදය යනු කුමක් ද? අනුවාදය පියසේන මානිල්ගම, ප්‍රගති ප්‍රකාශන මන්දිරය, මොස්කව් 1987
4. අරිසෙන් අහුබුදු, වැනුවා නම් ඔහු ගැන වැනුවා ම ය, කුමරතුගු මෙහෙවර ගැන වියත් මත (ලිපිය) ටෙනිසන් පෙරේරා, දෙසතිය, 1994. 02. 28 පිටුව 9
5. කුමාරතුංග මුණිදාස, ලක්මිණි පහන (කතුවැකිය), 1934 ජූලි 03
6. කුමාරතුංග මුණිදාස, ලක්මිණි පහන (කතුවැකිය), 1934 අගෝ. 28
7. කුමාරතුංග මුණිදාස, ලක්මිණි පහන (කතුවැකිය), 1934 අගෝ. 28
8. කුමාරතුංග මුණිදාස, ලක්මිණි පහන (කතුවැකිය), 1936 ජනවාරි 07
9. කුමාරතුංග මුණිදාස, ලක්මිණි පහන (කතුවැකිය), 1934 සැප්. 11
10. කුමාරතුංග මුණිදාස, ලක්මිණි පහන (කතුවැකිය), 1934 සැප්. 11
11. කුමාරතුංග මුණිදාස, විද්‍යෝදය සඟරාව, 10 කලාපය 1926